www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

**රැකියාවලින් දොට්ට දැමීම්, නිවාස අත්පත්කර ගැනීම් ඉහල යද්දී**

# ව්‍යාපාර ලෝකයට යලි ගොඩඒම සඳහා හොඳ කලක් උදාවේය යන එක්සත් ජනපද මහ බැංකුවේ පම්පෝරිය

## US Federel Reserve hails prospects for a business recovery

**බැරී ග්‍රේ විසිනි**

**2009 අගෝස්තු 14**

දශ ලක්ෂ සංඛ්‍යාත ඇමරිකානුවන්ට මෝරමින් ඇති ආර්ථික ව්‍යසනයක අඳුරු සෙවනැලි ගෙන එන විරැකියාව, නිවාස අත්පත්කර ගැනීම්, නිවාස මිල ගනන් හා සිල්ලර වෙලඳම පිලිබඳ නව දත්ත එලිබසිමින් තිබියදීත් ආර්ථික පුනර්ජීවනයක් අතලඟ බව අඟවන එක්සත් ජනපද ආර්ථිකය ''මට්ටම් වී ඇති බව'' (පහත වැටීම අවසන්වී ඇති බව) අගෝස්තු 12 වන දින මහ බැංකුව කියා සිටියේය.

දෙදින රැස්වීමකින් පසුව බැංකුවේ ෆෙඩරල් විවෘත වෙලඳපොල ප්‍රතිපත්ති තීරනය කරන කමිටුව විසින් පලකල ශුභවාදී තක්සේරුව, ආර්ථික අර්බුදයට ප්‍රතිචාර වශයෙන් එක්සත් ජනපද මහ බැංකුව හා ඔබාමා පරිපාලනය අනුගමනය කරන්නාවූ පන්ති පිලිවෙත පිලිබඳ ඇඟවුම් සහිතය.

එම ප්‍රකාශනය ආරම්භ වන්නේ ''මූල්‍ය වෙලඳපොලවල තත්ත්වය හොඳ අතට හැරී තිබෙන'' බව අවධාරනය කරමිනි. ''යම් කාලයකට ආර්ථික කටයුතු මන්දගාමීව පවතිනු ඇත.'' එහෙත් ''මූල්‍ය වෙලඳපොලවල් හා ආයතන ස්ථායී කිරීමේ ප්‍රතිපත්ති මෙහෙයුම්, මූල්‍ය හා රාජ්‍ය මූල්‍ය උත්තේජක වැඩ සටහන් හා වෙලඳපොල බලවේග, මිල ස්ථායීකරන සන්දර්භයක් තුල තිරසාර ආර්ථික වර්ධනය අනුක්‍රමයෙන් ගොඩනැගීඒමට දායක වනු ඇතැයි'' එය තවදුරටත් කියා සිටියි.

කුටුම්භයන්ගේ වියදම් ''රැකියා අහිමිවීම, පහත් නිවාස ධනය හා දැඩි නය කොන්දේසි මගින් සීමාවන බව'' මහබැංකුව ඒ හුස්මටම පිලිගනියි. සරල බසින් කිවහොත් මෙහි අර්ථය, වැටුප් පහත වැටෙන, කුටුම්භයන් සතු ධනය ඩොලර් ට්‍රිලියන් ගනනින් අතුගා දමමින් නිවාස මිල ගනන් පහත වැටෙද්දී, ආන්ඩුවේ ගතමනා හා සහන වශයෙන් ඩොලර් බිලියන සිය ගනන් ලබාගෙන ඇති බැංකු, පාරිභෝගිකයන්ට හා සුලු ව්‍යාපාරයන්ට දෙන නය දිගටම අත්හිටුවා ගෙන සිටින බවයි.

කෙසේ වෙතත් වැටුප්, සේවා කොන්දේසි හා වැඩකරන ජනතාවගේ ආදායම ගැඹුරු හා දිග් ගැස්සුන පරිහානියකට ඇද දැමීමේ කොන්දේසි මත, ව්‍යාපාර ලාභ දිගටම වැඩිවීමේ ඉඩක් පවතියි.

මහ බැංකුව මූල්‍ය වෙලඳපොලට නිකුත් කල පනිවිඩය වූයේ, තමන් දිගටම සිය පිලිවෙත ඔස්සේ ගමන් කරන බවයි. එනම්, ලාභ නය පහසුකම් සැපයීම, ප්‍රධාන සංගතයන්හි ආන්තික සීමා ඉහල නැංවීමට ''සියලු මෙවලම් යොදාගන්නා බව'' හා පසුගිය වසරේ සමපේක්ෂන මූල්‍ය උත්පාතය බිඳ වැටීමෙන් දුගී භාවයට පත් මිලියන ගනනකට සහන සැලසීම සඳහා කිසිවක් නොකරන අතර, බැංකු වල බොල්නය ආවරනය කරන බවයි.

වෝල් වීදිය එයට සිය අනුමැතිය පල කලේ, ඩව් ජෝන්ස් කාර්මික දර්ශකය 9,362 දක්වා ඒකක 121 කින් ඉහලට තල්ලු කරමින්, දෙදිනක් තුල අත්විඳි අලාභයට තිත තබමිනි. මහ බැංකු වාර්තාව ගැන අදහස් පලකරමින් ගෝල්ඩ්මන් සැක්ස්හි අර්ථශාස්ත්‍රඥ එඩ්වඩ් මැක්කෙල්වි විසින් අධ්‍යක්ෂ මන්ඩලවල පොදු මනෝභාවය මෙසේ ගෙනහැර දැක්වී ය. ''ඔවුන් කියන්නේ සියල්ල සැලැස්මට අනුව සිදුවන බව හා පිලිවෙත නොවෙනස්වනු ඇති බවයි.''

රැයක් තුල බැංකු අතර එහා මෙහා වන නය සඳහා ගෙවිය යුතු පොලිය නියම කරන, පාදක ෆෙඩරල් අරමුදල් අනුපාතය අනාගත කාලයක් සඳහා ද සියයට 0 සිට 0.25 අතර මට්ටමක දිගටම පවත්වාගෙන යන බව මහබැංකුව නිවේදනය කලේය. එසේම එය, ඩොලර් බිලියන 300 ක් දක්වා භාන්ඩාගාර බැඳුම්කර මිලට ගැනීමේ වැඩ සටහන ඔක්තෝබර් මාසයේදී නතර කර දමන බවට ද රජය සතු උකස් මූල්‍ය නය පිලිබඳ යෝධයන් වන ෆැනී මේ හා ෆ්‍රෙඩී මැක් ආයතනවල ආවරනය සහිත ට්‍රිලියන 1.25 ක් දක්වා වූ උකස් වලින් පිටුබලය ලැබෙන සුරැකුම් මිලට ගැනීම දිගටම සිදුකරන බවට හා වසර අවසානයේ එම ආයතනවල බිලියන 200 ක් වන නය ආවරනය කරන බව ද කියා සිටියේය.

මහබැංකුවේ ම ප්‍රක්ෂේපනයක් වන, ඔබාමා පරිපාලනය හා මහබැංකුව විසින් හුවා දක්වන ආර්ථිකයේ ''ගොඩඒමක්'' පිලිබඳ කථාන්තරය, ඇඟවුම් සහිතය. එයට අනුව එක්සත් ජනපද ආර්ථිකය මේ වසරේ දෙවන භාගය තුල ප්‍රසාරනය වීමට පටන්

ගන්නා අතර 2010 තුල අනුක්‍රමයෙන් වේගය වැඩිකරගනු ඇත. සියල්ල සැලැස්මට අනුව සිදුවන්නේ නම් පවා මහබැංකුවේ අපේක්ෂිත විරැකියා අනුපාතය දැනටමත් පවතින වේදනාකාරී නිල අනුපාතය වන සියයට 9.4 සිට ලබන වසර අවසන් වන විට සියයට 9.8 ක් තරම් දක්වා ඉහල යනු ඇත. අර්ථශාස්ත්‍රඥයන් බොහොමයක් අනාවැකි පල කරන්නේ නිල අනුපාතය සියයට 10 ඉක්මවනු ඇත කියා ය.

මහජන විරැකියාව යොදාගනු ලබන්නේ කම්කරුවන්ගේ වැටුප් හා සේවා තත්ත්වයන් පහත හෙලීමටත් ශ්‍රම පලදායිත්වය ඉහල නැංවීමටත් ය. මෙය මහා ව්‍යාපාර වෙනුවෙන් ඉහල ලාභ සහතික කරන මනා සංකලනයකි. 11 වන දින කම්කරු දෙපාර්තමේන්තුව වාර්තා කලේ 2009 වසරේ දෙවන කාර්තුව තුල එක්සත් ජනපදයේ ශ්‍රම පලදායිත්වය, වාර්ෂික අනුපාතයකට අනුව සියයට 6.3 කින් ඉහල නැග ඇති බවයි. මෙය වසර 2000 සිට 2008 දක්වා කාලය තුල ශ්‍රම පලදායිත්වයේ වාර්ෂික සාමාන්‍ය වූ සියයට 2.6 සමඟ සැසඳිය හැකිය.

සේවකයන් නිවාඩු ගැන්වීම හා අනෙකුත් කප්පාදු මඟින් සතියක වැඩ පැය ගනන වාර්තාගත ලෙස පහත හෙලීමේ ප්‍රතිපලය, පලදායිත්වය තියුනුව ඉහල නැඟීමයි. වැඩකල පැය ගනනට සමානුපාතිකව උපයාගත් වැටුප්, නිමැවුමට වඩා බොහෝ වේගයෙන් පහත වැටී තිබේ. පුලුල් වන රැකියා විරහිතයන්ගේ ගොඩට වැටීමේ තර්ජනය හමුවේ කම්කරුවන්ට, තමන් සේවයෙහි නිරතව සිටින අතර තුර වැඩි වැඩියෙන් නිපදවීමට බලකෙරී තිබේ.

කම්කරු දෙපාර්තමේන්තුව ඒ අතරම වාර්තා කලේ වාර්ෂික අනුපාතයකට අනුව දෙවන කාර්තුව තුල පැයක සඵල සේවක වන්දි සියයට 2.2 කින් පහත වැටී ඇති බවයි. වැටුප් පහත වැටීමේ හා පලදායිත්වය ඉහල නැඟීමේ සංකලිත බලපෑමේ ප්‍රතිපලයක් ලෙස, අප්‍රේල්-ජූනි දක්වා තෙමසක කාලය තුල ඒකකයක ශ්‍රම පිරිවැය සියයට 5.8 ක තරම් විශාල ප්‍රමානයකින් පහත වැටී තිබේ.

එක් ප්‍රකාශකයෙකු පෙන්වා දුන් පරිදි, ආර්ථිකයේ ''ව්‍යුහාත්මක වෙනස්කම්'' ඇතිකිරීම සඳහා අර්බුදය උපයෝගී කරගෙන තිබේ. වෙනත් වචන වලින් කිවහොත් වැටුප් පහත හෙලීම, ප්‍රතිලාභ අහෝසි කිරීම හා වැඩ වේගවත් කිරීම ආර්ථික පසුබෑම අවසන්වී ඇති බවට නිල වශයෙන් ප්‍රකාශ කිරීමෙන් අනතුරුවත් ස්ථාවර සංශෝධන ලෙස ඒ ආකාරයට ම පවතිනු ඇත.

මේ සතිය තුල නිකුත් කල වාර්තා ගනනාවකින්ම, ''ගොඩඒමක්'' පිලිබඳ ආන්ඩුවේ හා මාධ්‍යවල රැලි වන ශුභවාදී උත්සවශ්‍රීයට කෙටි විරාමයක් තබන, ප්‍රගාඪ සමාජ අර්බුදය දෙසට ඇඟිල්ල දිගු කොට ඇත. කම්කරු දෙපාර්තමේන්තුව 12 දින වාර්තා කලේ, රජයේ විරැකියා සහන ප්‍රථම වතාවට ඉල්ලුම් කරන්නන්ගේ සංඛ්‍යාව 4000 කින් වැඩිවී පසුගිය සතියේදී, කාලයට අනුකූලව සංශෝධනය කල 558,000 ක් බවට පත්ව තිබෙන බවයි. සති හතර තුල වෙනස්වන සමාන්‍යය 565,000 දක්වා 8,500 කින් වැඩි විය. ආර්ථිකය රැකියා කැපීම නතරකිරීමට පෙරාතුව ම නිකුත්කල මුල් ප්‍රකාශවලට අනුව එය 400,000 ටත් වඩා පහත වැටිය යුතුව තිබුනි.

දිගු කලක් තිස්සේ විරැකියා සහන ලබාගන්නා මිනිසුන්ගේ සංඛ්‍යාව අගෝස්තු 1 වන දිනෙන් අවසන් සතියේදී 141,000 කින් අඩුවූ අතර, අප්‍රේල් මැද භාගයෙන් පසුව එහි පහතම මට්ටම වන මිලියන 6.2 කට ලගාවිය. කෙසේ වෙතත් මෙය බොහෝ කොටම කම්කරුවන් ඔවුන්ගේ විරැකියා සහන වලින් හෙම්බත්ව සිටීමේ ප්‍රතිපලයකි. සති 27 ක් හෝ ඊට වැඩි කාලයක් රැකියාවක නිරත නොවූ මිනිසුන්ගේ සංඛ්‍යාව ජුලි මාසය තුල වාර්තාගත මිලියන 5 ක් දක්වා වැඩිවී ඇති අතර, එය රැකියා විරහිතයන්ගෙන් තුනෙන් එකක ප්‍රමානයකි.

බිහිවන එක් රැකියාවකට රැකියා නැති මිනිසුන් හය දෙනෙක් වන අතර පූර්න කාලීන රැකියාවන් නොකරන කම්කරුවන් සැහෙන තරම් අඩුවෙන් තක්සේරු කර ඇති ආන්ඩුවේ සංඛ්‍යාලේඛන වලට අනුව පවා දැනට රැකියා නැති ඇමරිකානුන් ගේ සංඛ්‍යාව මිලියන 14 කි.

කම්කරු දෙපාර්තමේන්තුව 12 දින වාර්තා කලේ මෙම වසරේ දෙවන කාර්තුව තුල මහා පරිමාන දොට්ට දැමීම් හේතුකොට ගෙන කම්කරුවන් ලක්ෂ පහකට වැඩි සංඛ්‍යාවක් පීඩාවට පත්වූ බවයි. මෙය දත්ත රැස්කිරීම ආරම්භ කල 1995 වසරෙන් පසු කාර්තුවක් තුල වාර්තාගත ඉහලම මට්ටමයි. වැඩපොලක අඩුම තරමින් කම්කරුවන් 50 කට වත් බලපෑ තොග පිටින් නෙරපා හැරීම් 2,994 ක් හාම්පුතුන් විසින් ක්‍රියාවට නඟා තිබේ. කාර්තු අනුව ගත් කල මෙම සංඛ්‍යාව ද වාර්තාවකි. යම් ආකරයක යලි බඳවාගැනීමක් අපේක්ෂා කරන බව පවසා ඇත්තේ හාම්පුතුන්ගෙන් සියයට 38 ක් පමනි. මෙය ද වාර්තාගත පහත්ම අනුපාතයකි.

මේ සතිය තුල නිවේදනය කල තොග පිටින් දොට්ට දැමීම් අතර-

* සෞඛ්‍ය සේවයේ යෝධයෙකු වන කැලිෆෝනියාවේ කයිසර් පර්මනන්ටේ අඟහරුවාදා අහෝසි කල රැකියා 1,830.

* ඩෙල්ටා ගුවන් සේවය, කලමනාකරන හා පරිපාලන මට්ටමේ නිශ්චය නොකල රැකියා ප්‍රමානයක් අහෝසි කරන බව නිවේදනය කලේය.

* ගැනට් නමැත්තා සතු රටේ විශාලතම පුවත්පත් ජාලයක් වන නිව් යෝර්ක් හි වෙස්ට්චෙස්ටර් ජර්නල් නිව්ස්, රැකියා 70 ක් කපන බව කියා සිටියේය.

* කැන්සාස් ප්‍රාන්තයේ විචිටාහි පිහිටි ව්‍යාපාරික ජෙට් යානා නිපදවන හෝකර් බීච්ක්‍රාෆ්ට් 12 වන දින තම සේවකයන්ට දැනුම් දුන්නේ, නෙරපා හැරීම් හා සේවක සහන සංශෝධනය කිරීම දැනට සලකා බැලෙමින් තිබෙන බවයි.

රැකියා අර්බුදය වෙන කවරදාකටත් වඩා කම්කරුවන් මත බලපා තිබේ. නිවාස අත්පත්කර ගැනීම් පිළිබඳ සංඛ්‍යා රැස්කරන රියල්ටි ට්‍රැක් මේ සතිය තුල වාර්තා කලේ එක්සත් ජනපදයේ නිවාස නය ජූලි මාසය තුල වාර්තාගත මට්ටමකින් වැටී ඇති බවයි. එම සමාගම, ජූලි මාසය තුල නිවාස අත්පත්කර ගැනීමේ නිවේදන 360,149 ක් එනම් ඊට පෙර මාසයට වඩා සියයට 7 ක් තරම් ද, 2008 වසරේ එම මාසයට වඩා සියයට 32 ක ද, නැඟීමක් පෙන්නුම් කරන බව සඳහන් කරයි.

නැෂනල් ඇසෝසියේෂන් ඔෆ් රියල්ටර්ස් වාර්තා කලේ නිවාස අලෙවිය වැඩිවන අතර වාරයේ නිවාස මිල ගනන් දිගටම පහත වැටෙමින් තිබෙන බවයි. දෙවන කාර්තුවේ දී එය පසුගිය වසරේ එම කාර්තුවට වඩා සියයට 15.6 කින් වැටී ඇත. නාගරික ප්‍රදේශවලින් සියයට 80 කම පහත් නිවාස මිල ගනන් වාර්තා විය.

අවසාන වශයෙන් එක්සත් ජනපදයේ සිල්ලර වෙලඳම පහත වැටුනේ මහජන විරැකියාවේත් වැටුප් පහත වැටීමේත් වැඩෙන බලපෑම පිලිබිඹු කරමිනි. ජූලි මාසයේ රිනාත්මක අලෙවි වාර්තා, සුලු වශයෙන් මාසිකව සිදුවූ ඉහලයාමේ මෑත ප්‍රවනතාවය අපසු හරවා තිබේ. අර්ථශාස්ත්‍රඥයන් සියයට 0.7 ක වර්ධනයක් පිලිබඳව අනාවැකි පලකොට තිබුන ද මුලු සිල්ලර අලෙවිය සියයට 0.1 කින් පහල ගිය බව 13 වන දින වෙලඳ දෙපාර්තමේන්තුව වාර්තා කලේ ය.

© www.wsws.org